ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022-11-04

පැමිණිලි පාර්ශවය : වයි.කේ. කුරුප්පු මිය,
අංක 3/8, කිංසි පාර,
කොළඹ 08.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
ආනන්ද විද්‍යාලය,
කොළඹ 10.

පැමිණිලි අංකය : HRC/19/21

පැමිණිල්ල =:

ඉහත නම් සඳහන් පෙත්සම්කාරිය 2021-01-08 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා වන එච්.කේ. රුසඳු වන්කෙත් හෙට්ටිආරච්චි දරුවා 2021 වසරේ කොළඹ ආනන්ද විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්පත්‍ර ඉදිරිපත් කළ බවත්, ඒ අනුව CO 139 අංකය යටතේ 2021-01-05 වන දින සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වූ අවස්ථාවේදී පැමිණිලිකාරිය විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය සමග තිබූ බදු ඔප්පුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පත්කරන ලද නීතිඥ මඩුල්ලේත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එකී බදු ඔප්පුවට අයත් දේපළ බැංකුවට උගස් කර ඇති දේපළක් බව පවසා මෙකී දේපලේ අයිතිය බැංකුව සතු බව කියමින් වැරදි අවබෝධයක් මත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අසුන් ගැනීමට ප්‍රථම පැමිණිලිකාරියව ඉවත් කළ බවයි.

තවද මෙම පාසල තමාට ඉතා ආසන්නම පාසල බවත්, වගඋත්තරකාර පාර්ශවය විසින් ඇයගේ අයදුම්පත්‍රය සලකා බැලීමෙන් තොරව සහ ඇයට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ කරුණු දැක්වීමට අවස්ථාවක් නොදී ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව ඇය විසින් මේ පිළිබඳව අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කර ඇතත්, ඇයට එම මණ්ඩලයෙන්ද කැඳවීමක් හෝ සහනයක් ලබා දීමක් සිදු කර නොමැති වීම මත ඇයගේ දරුවාගේ අධ්‍යාපනයට හා



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අනාගතයට දැඩි බලපෑමක් සිදු වූ හෙයින්, මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කර ඇයට සුදුසු සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත.

පෙත්සම්කාරිය කොමිසන් සභාවට ඉදිරිපත් කර තිබූ පෙත්සම සමග ඇය විසින් වගඋත්තරකාර පාසලට ඉදිරිපත් කරන ලද ප්‍රධාන ලේඛනයක් වන අංක 1536 දරණ ප්‍රසිද්ධ නොතාරිස් කේ.සී.එච්. පීරිස් විසින් ලියා සහතික කළ 2019-05-15 වන දින කොළඹ 07, ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කළ බදු ඔප්පුවේ පිටපතේ උපලේඛනයේ සඳහන් වරිපනම් අංක 3/8 දරණ මෙම ඉඩමේ පිහිටි ගොඩනැගිල්ලේ උඩ මහල වර්ෂ 2015-01-01 දින සිට 2022-12-31 දින දක්වා පුරා අවුරුදු හත (07)ක බද්දට ලබා ගෙන ඇති බවට අනාවරණය වේ.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව විසින් 2022-04-18 වන දින දෙපාර්ශවය කැඳවා පරීක්ෂණයක් සිදු කර ඇති අතර, වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් කොළඹ ආනන්ද විද්‍යාලයේ සහකාර විදුහල්පති කේ. එම්. වික්‍රමසේකර සහ උපගුරු ආර්.ඒ.එස්. ලක්ෂිත යන අය පෙනී සිටිමින් සඳහන් කර ඇත්තේ, පෙත්සම්කාරියගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂෙප කිරීමට සිදු වී ඇත්තේ, ඇයගේ අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරන ලද බදු ගත්තා ලද දේපලහි පත්ඉරු අමුණා නොමැති වීමත්, විද්‍යාලයේ නීති උපදේශක මණ්ඩලයේ නිර්දේශය මත ඇයගේ අයදුම්පත්‍රය නිෂ්ප්‍රභා කර තිබීමත්, පෙත්සම්කාරිය විසින් විදුහල්පතිවරයා අමතා අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවට සඳහන් කර ඇතත්, එකී අභියාචනය විද්‍යාලයට නොලැබීමත් මත බව දක්වා ඇත.

මෙහිදී පැමිණිලිකාරිය විසින් විදුහල්පතිවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවට කරුණු ඉදිරිපත් කළද, මෙම අවස්ථාවේදී එය ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන තමන් වෙත නොමැති බවත්, ඉදිරියේදී අභියාචනය ලියාපදිංචි තැපෑලෙන් නිකුත් කරන ලද තැපැල් භාණ්ඩ කුවිතාන්සිය කඩිනමින් කොමිසන් සභාවට ඉදිරිපත් කිරීමට හැකි බවත් දක්වා ඇත.

2022-04-22 දිනැති පැමිණිලි පාර්ශවයේ ලිඛිත දේශනය කොමිසන් සභාවට ලැබී ඇති අතර, පෙත්සම්කාරිය ඇයගේ මුල් පැමිණිල්ලේදී සඳහන් කර ඇත්තේ, ඇය විසින් පාසල වෙත ඉදිරිපත් කරන ලද බදු ඔප්පුව එම දේපලෙහි අයිතිකරු විසින් වාණිජ බැංකුවට උගස් කර දේපලක් බැව් හා එකී දේපලෙහි අයිතිය මේ වන විට බැංකුව සතු බව අනවබෝධයකින් ඇයගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂෙප කර ඇති බවයි.

පෙත්සම්කාරියගේ නීතිඥවරිය ඇයගේ ලිඛිත දේශනයේ පෙන්වා දී ඇත්තේ **"උකස් ඔප්පුවක් මත කිසිදු විටක අයිතිය බැහැරවීමක් සිදු නොවේ. එවැනි අයිතිය බැහැරවීමක් සිදු වන්නේ එලෙස දේපළ ඇපයට තබා ගත්තා ණය එකග වූ ප්‍රකාරව ආපසු නොගෙවන ලද හොත් එකී උගසේ කොන්දේසි**

ප්‍රකාරව ණය මුදල අය කර ගැනීම සඳහා වෙන්දේසියේ විකුණන ලද හොත් ණය අය කර ගැනීමේ විශේෂ විධිවිධාන පනත යටතේ එකී දේපලයෙහි අයිතිය බැංකුවට පවරා ගන්නා ලදහොත් සහ / හෝ නීත්‍යානුකූලව පවරා දෙනු ලැබුවහොත්ය." යන්න වේ.

තවද, "එවැනි කිසිදු ක්‍රියාමාර්ගයක් බැංකුව විසින් ගෙන නොමැති අතර, මෙම දේපලට අදාලව බඳු ගිවිසුම් වලට එළඹීම සම්බන්ධයෙන් තමාගේ කිසිදු විරෝධතාවයක් නොමැති බවට බැංකුව වෙනුවෙන් ලිපියක් ඉදිරිපත් කර ඇත." ලෙස දක්වා ඇත.

එසේම " කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි කිරීමක් කිරීමට පෙත්සම්කාරියට අවස්ථාව ලබා නොදීම පමණක් නොව එවැනි අවකාශයකට අවස්ථාව අහුරන පරිදි විදුහල්පතිවරයා හිතාමතාම පෙත්සම්කාරිය විසින් මේ සම්බන්ධව විදුහල්පතිවරයාට කරන ලද ඇපලටද කිසිදු හෝ ප්‍රතිචාරයක් නොදැක්වීම මත එකී පැහැදිලි කිරීමක් කිරීමේ අවස්ථාව ඉල්ලුම්කාරියගෙන් පැහැරගෙන ඇත." වශයෙන්ද දක්වා ඇත.

නිරීක්ෂණ =:

පෙත්සම්කාරියගේ ලිඛිත දේශනයෙන් අනතුරුව එහි සඳහන් වූ බැංකුව විසින් නිකුත් කරන ලද 2021-01-26 දිනැති කොළඹ පිටකොටුව ලංකා බැංකුවේ ප්‍රධාන කළමණාකරුවරයාගේ අත්සනින් යුතුව පෙත්සම්කාරියගේ ස්වාමිපුරුෂයා වෙත ඉදිරිපත් කරන ලිපියට අනුව බැංකුව විසින් දක්වා ඇත්තේ, 'පෙත්සම්කාරිය විසින් බදු ගිවිසුමට ලබා ගන්නා ලද වරිපනම් අංක 3/8 ගොඩනැගිල්ලේ මේ වන විටත් තමාගේ බැංකුව වෙත උගස් කළ දේපලක් බවත්, එකී දේපළ අයිතිකරු විසින් බදු දීම පිළිබඳව තමාගේ කිසිදු විරෝධතාවයක් නොමැති බවත්ය'. කෙසේ වෙතත්, පෙත්සම්කාරිය විසින් සම්මුඛ පරීක්ෂණ දිනයේදී පැනනැගු මෙම ගැටළුවට පිළිතුරක් ලබා දීමට පවා වගඋත්තරකාර පාසල විසින් ඇයට අවස්ථාවක් ලබා දී නොමැති බව අනාවරණය වේ.

තවද, පරීක්ෂණ අවස්ථාවේදී පෙත්සම්කාරිය විසින් සඳහන් කරන ලද ආකාරයට ඇය විසින් වගඋත්තරකාර පාසලේ විදුහල්පතිවරයා අමතා අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවට තහවුරු කිරීමට අවශ්‍ය ලියාපදිංචි තැපැල් කරන ලද 8020 දරණ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.
එම අභියාචනයකටද වගඋත්තරකාර පාසල විසින් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැති බව තවදුරටත් අනාවරණය වේ.

තවද, මෙහිදී අනාවරණය වූ තවත් කරුණක් වන්නේ පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තරකරු විසින් පවසා සිටියේ පෙත්සම්කාරිය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය සමග බදු ගිවිසුම සම්බන්ධ දේපලෙහි පත්තිරු අමුණා නොමැති බවත්, ඒ හේතුවෙන් පැමිණිලිකාරියගේ

අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වූ බවත්ය. මෙහිදී පැන නගින ප්‍රශ්නය වන්නේ, වගඋත්තරකාර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පත් කරන ලද නීතිඥ මඩුල්ල පවසා සිටින ලද්දේ පෙත්සම්කාරිය විසින් ඉදිරිපත් කරන වරිපනම් අංක 3/8 දේපළ බැංකුව සතු දේපළක් බව පත්තිරු නොමැතිව දැනගත්තේ කෙසේද යන්න පිළිබඳවයි. මෙහිදී වගඋත්තරකාර පාර්ශවය කිසිදු නෛතික පදනමකින් තොරව පෙත්සම්කාරියගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කර ඇති බව නිරීක්ෂණය වේ.

සම්මුඛ පරීක්ෂණ දිනයේ පෙත්සම්කාරියගේ බදු ගිවිසුමක් හරහා ගන්නා වූ කොළඹ 08, කිංසි පාර, අංක 3/8 පිහිටි ගොඩනැගිල්ලේ උඩු මහළ මේ වන විට බැංකුව සතු දේපළක් බවට පවසමින් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කර තිබූ අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේදී පැවැති 2022-04-18 වන දින පැවැති පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නියෝජිතයන් සඳහන් කර ඇත්තේ, පෙත්සම්කාරිය බදු ඔප්පුව පිළිබඳව පත්ඉරු අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කර නොමැති බවයි.

පත්ඉරු ඉදිරිපත් නොකලේනම් නිතිඥ මඩුල්ල, පෙත්සම්කාරිය විසින් ලබා ගන්නා ලද මෙම නිවාස බැංකුව සතු දේපළක් බව තිරණය කරන ලද්දේ කෙසේද යන්න ගැටළු සහගතය. තවද මෙහිදී පෙත්සම්කාරියගේ නිතිඥ මහත්මිය ඉදිරිපත් කරන ලද තර්කය දෙස අවධානය යොමු කිරීමේදීද බැංකුවට උගස් තබා ගැනීමෙන් පමණක් අදාළ දේපළ බැංකුව සතු දේපළක් බවට තිරණය කිරීම කිසිසේත්ම සාධාරණ නොවේ. එම උගස් තැබීමේ පදනම මත අදාළ පෙත්සම්කාරියගේ දරුවාට සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමෙන් තොරව හරවා එවීම පිළිගත නොහැකි ක්‍රියාවක් බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණය වේ.

**නිගමනය** :-

මෙහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ උපදෙස් මත පෙත්සම්කාරියට සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට තිබූ අවස්ථාව පැහැරගැර ඇති බවත්, ඇයට තමන් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමට තිබූ අවස්ථාව වලක්වා ඇති බවත්, ඇයට මේ සම්බන්ධව අනෙක් අයදුම්කරුවන් හා සමාන නීතිමය රැකවරණය නොලැබීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් නීතිය ඉදිරියේ සමානාත්මකමින් සැලකීම වගඋත්තරකරු විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය** :-

ඒ අනුව, පෙත්සම්කාරියගේ දරුවා කොළඹ ආනන්ද විද්‍යාලයේ පළමු ශ්‍රේණියට (2021) ඇතුළත් කිරීමට අවශ්‍ය අයදුම්පත්‍ර හා චක්‍රලේඛ ප්‍රකාරව ඇය විසින් ඉදිරිපත් කරන ලද අතිකුත් ලේඛන පිළිබඳව සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී කරුණු ඉදිරිපත් කිරීමට

අවස්ථාවක් ලබා දෙන ලෙසට හා අදාළ වර්ෂයට අයත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනයට අනුව පෙත්සම්කාරියට 2021 වර්ෂයට අදාළ ලකුණු මට්ටමට ලගා වීමට හැකිවූවහොත් ඇයගේ දරුවා වගඋත්තරකාර පාසලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විදුහල්පති, ආනන්ද විද්‍යාලය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 12 . 20 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7)වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධ පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ (ජාතික පාසැල්),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/